# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1905/5 - 2015 මාර්තු මස 09 වැනි සඳුදා - 2015.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

### නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත් කිරීම්

නැගෙනහිර පළාතේ, ආණ්ඩුකාරවර ඔස්ටින් ප්‍රනාන්දු වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154ඒෆ් (1), (4) සහ (5) වැනි වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකර පහත සඳහන් පත් කිරීම් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1. | ගරු අහමඩ් නසීර් සෙයිනුලාබ්ඩීන් මැතිතුමා | - | නැගෙනහිර පළාත් සභාවේ මහ ඇමති වශයෙන් සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා ප්‍රාදේශීය පරිපාලන, ග්‍රාමීය සංවර්ධන, සංචාරක හා පාරිසරික, ගොඩනැගිලි හා ඉදිකිරීම්, ප්‍රවාහන, ග්‍රාමීය කර්මාන්ත හා නිවාස අමාත්‍යවරයා වශයෙන් 2015ක් වූ මාර්තු මස 03 වැනි දින සිට. |
| | අමාත්‍යාංශ ලේකම් වශයෙන් | - | යූ. එල්. ඒ. අසීස් මහතා - ශ්‍රී. ලං. ප. සේ. (විශේෂ ශ්‍රේණිය) |
| 2. | ගරු ඉබ්‍රාහිම් මොහොමඩ් මොහොමඩ් මන්සූර් මැතිතුමා | - | නැගෙනහිර පළාත් සභාවේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂණ සේවා, සමාජ සුභසාධන සහ ග්‍රාමීය විදුලි බලය යෙදීමේ අමාත්‍යවරයා වශයෙන් 2015ක් වූ මාර්තු මස 03 වැනි දින සිට |
| | අමාත්‍යාංශ ලේකම් වශයෙන් | - | කේ. කරුණාහරන් මහතා - ශ්‍රී. ලං. ප. සේ. (විශේෂ ශ්‍රේණිය) |
| 3. | ගරු කිරුෂ්ණපිල්ලෙයි තුරෙයිරාසසිංගම් මැතිතුමා | - | නැගෙනහිර පළාත් සභාවේ කෘෂිකර්ම, වාරිමාර්ග, සමූපකාර සංවර්ධන, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, ධීවර, ආහාර සැපයුම් හා බෙදාහැරීම් සහ සමූපකාර සේවක කොමිසමේ අමාත්‍යවරයා වශයෙන් 2015ක් වූ මාර්තු මස 03 වැනි දින සිට |
| | අමාත්‍යාංශ ලේකම් වශයෙන් | - | කේ. සිවනාදන් මහතා - ශ්‍රී. ලං. ප. සේ. (විශේෂ ශ්‍රේණිය) |

| | | |
|---|---|---|
| 4. ගරු සිංගාරවේලු තන්ඩායුදපානි මැතිතුමා | - | නැගෙනහිර පළාත් සභාවේ අධ්‍යාපන, තොරතුරු, තාක්ෂණ අධ්‍යාපන, පෙර පාසැල් අධ්‍යාපන, ක්‍රීඩා, සංස්කෘතික කටයුතු, තරුණ කටයුතු හා පුනරුත්ථාපන හා නැවත පදිංචිකිරීම් අමාත්‍යවරයා වශයෙන් 2015ක් වූ මාර්තු මස 03 වැනි දින සිට |
| අමාත්‍යාංශ ලේකම් වශයෙන් | - | එච්. ඊ. එම්. ඩබ්. පී. දිසානායක මහතා (වැඩ බලන) ශ්‍රී. ලං. ප. සේ. - I |
| 5. ගරු ආරියවතී ගලප්පත්ති මැතිණිය | - | නැගෙනහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, නිපුනතා හා මිනිස්බල සංවර්ධන, කාන්තා කටයුතු සහ ජල සම්පාදන අමාත්‍යවරිය වශයෙන් 2015ක් වූ මාර්තු මස 03 වැනි දින සිට |
| අමාත්‍යාංශ ලේකම් වශයෙන් | - | ඒ. එච්. එම්. අන්සාර් මහතා - ශ්‍රී. ලං. ප. සේ. (විශේෂ ශ්‍රේණිය) |

ඔස්ටින් ප්‍රනාන්දු,
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

2015ක් වූ පෙබරවාරි මස 05 වැනි දින,

03- 663

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.